# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## උපකුලපති තනතුර
## සඳහා අයදුම්පත්‍ර/ නාම යෝජනා කැඳවීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරය ආසන්නයේ පිහිටා ඇති කීර්තිමත් ඉතිහාසයක් සහිත වර්තමානයේ පීඨ එකොළහකින් සමන්විත ශ්‍රී ලංකාවේ වැඩිම අභ්‍යන්තර ශිෂ්‍ය ප්‍රජාවක් අධ්‍යයන කටයුතු වල නිරත වන, විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව සීඝ්‍ර වර්ධනයක් ලබා කර ගනිමින් සිටින රාජ්‍ය විශ්වවිද්‍යාලයකි.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධන නියමයන් ද අංක 02/2020 කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ව ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලක සභාව උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් / නාම යෝජනා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන්/නාමිකයන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු හැට තුනට (63)ට අඩු විය යුතුයි. උපකුලපති තනතුරින් කලින් ඉවත් කළ හොත් හෝ සේවය අත්හැරිය හොත් හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියෙක් වන අතර, ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වේ. නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපතිවරයා ද වේ.

උපකුලපතිවරයා අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වා දීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාල සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍ය භාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම උත්ථම්බනය කළ යුතු වේ.

ප්‍රබල පර්යේෂණ පැති කඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ වාස්තවිකව ගණුදෙණු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලීය ජයග්‍රහණ වාර්තාවන් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මක භාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු/ඇය සතුව තිබිය යුතුය.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, තනතුරට අදාළ අනෙකුත් දීමනා හා පහසුකම් ලැබීමට හිමිකම් ලබයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 02/2020 හි සඳහන් මතු සඳහන් කර ඇති කරුණු පදනම් කර ගෙන ඇගයීම් කමිටුවක් විසින් අයදුම්කරුවන්/නාමිකයන් ගේ අයදුම්පත්‍ර සමාලෝචනයට හා තක්සේරු කිරීමකට භාජනය කරනු ලැබේ.

I. උපාය මාර්ගික අවධානය
II. ඵලදායී නායකත්වය
III. සමස්ත චින්තනය/ සංකල්පමය කුසලතා
IV. ශාස්ත්‍රීය හා පර්යේෂණ විශිෂ්ටත්වය
V. පුද්ගලික අඛණ්ඩතාව
VI වෘත්තීය සන්නිවේදනය
VII. කළමනාකරණ නිපුණතාව

යම් අයදුම්කරුවකු/නාමිකයකුට ඇගයීම් කමිටුවට භෞතිකව පැමිණිය නොහැකි වේ නම් ඔහු/ඇය වීඩියෝ තාක්ෂණය ඔස්සේ සහභාගී විය හැකිය.

ඇගයීම් කමිටුව විසින් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අතරින් තිදෙනකු (03) තෝරා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන ඇගයීමේදී අයදුම්කරුවන් පාලක සභාව හමුවේ විනාඩි දහයක (10) ක හෝ උපරිම විනාඩි පහළොවක (15)කට යටත් ව විශ්වවිද්‍යාලයේ අභිවර්ධනය සඳහා ස්වකීය දර්ශනය/දැක්ම පිළිබඳ මූලික හැඳින්වීමක් හා ධුරයට පත් කරනු ලැබුව හොත් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත යෝජනා පිළිබඳ සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමක් කළ යුතුය වේ.

පාලක සභාව විසින් අයදුම්කරුවන්/ නාමිකයන් අතරින් සුදුසුකම් ලැබූ තිදෙනෙකුගේ (03) නම් අනුපිළිවෙළින් තෝරා උපකුලපති තනතුරට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

අයදුම්පත්‍ර /නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

1. අයදුම්කරු/නාමිකයාගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු. (නම, උපන් දිනය, ලිපිනය, දුරකථන අංක හා විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළුව)
2. ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම්
3. වර්තමාන තනතුර
4. දැරූ තනතුරු කාල වකවානු සහිතව
5. පරිපාලන පරිචය
6. වෘත්තීය අනුබද්ධතා
7. පර්යේෂණ පරිචය හා වෙනත් අදාළ තොරතුරු
8. අයදුම්කරු තෝරා ගනු ලැබුව හොත් විශ්වවිද්‍යාලයේ අභිවර්ධනය සඳහා ස්වකීය දර්ශනය/ දැක්ම පිළිබඳ මූලික ප්‍රකාශයක්.
9. උපකුලපති තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඉටු කිරීමට යෝජිත කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක්
10. අයදුම්කරු/නාමික දැනට උපකුලපති තනතුර දරන හෝ විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුර හොබවා ඇත් නම්, එම කාලය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්තාවක්.
11. නාම යෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්.
12. අයදුම්කරු/ නාමිකයන් රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු/නාමිකයා තනතුර සඳහා තෝරා ගනු ලැබුව හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලිපියක්.

උපකුලපති තනතුර සඳහා අයදුම් පත්‍ර/ නාම යෝජනා කැඳවීමට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2020.05.04 දිනැතිව නිකුත් කරන ලද 02/2020 චක්‍ර ලේඛය අදාළ වන අතර එය http://www.sjp.ac.lkවෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

අයදුම්පත්‍ර හා නාම යෝජනා අදාළ ලේඛන බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතු වේ.

අයදුම්පත්‍ර/ නාම යෝජනා **2022** දෙසැම්බර් මස **22** දින ප.ව. **3.00** ට හෝ ඊට ප්‍රථම **"ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට කටයුතු කිරීම හෝ පෞද්ගලිකව පැමිණ භාර දීම සිදු කළ යුතු වේ.

අයදුම්පත්‍ර/ නාම යෝජනා භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත්‍ර/ නාම යෝජනා සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී හා පාලක සභාවේ ලේකම්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2022.11.21